# මාධ්‍ය නිවේදනයයි

2008-07-24

Visit our web site
www.tisrilanka.org

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
Building a Nation of integrity

28/1, Bullers Lane, Colombo 07
Tel/Fax: 0112-501474, 0112-592287
Email: tisl@sltnet.lk
Web: http://www.tisrilanka.org

## රාජ්‍ය ව්‍යවසාය කමිටුවට (COPE) හා රාජ්‍ය ගිණුම් කමිටුවට (PAC) පත් කල නව සභාපතිවරුන්ට ඉල්ලා අස්වන ලෙස ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය බලකර සිටී.

රාජ්‍ය ව්‍යවසාය කමිටුවට හා රාජ්‍ය ගිණුම් කමිටුවට, සභාපතිවරුන් ලෙස ඇමතිවරුන් දෙපොලක් පත් කිරීම, "විධායකය විසින් නිරතුරුව සිදු කරනු ලබන මූල්‍ය අක්‍රමිකතාවන් බාධාවකින් තොරව සිදු කර ගෙන යාම සඳහා හිතාමතාම කර ඇති ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරක් " ලෙස ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය පෙන්වා දේ.

පාර්ලිමේන්තු සුපරීක්ෂණ කමිටු වල සාමාජිකත්වයට අමාත්‍යවරුන් පත් කිරීමත්, ඒවායේ සභාපතිත්වයට අමාත්‍යවරුන් පත් කිරීමත් යන්න ලොව පිළිගත් සියලු පාර්ලිමේන්තු සම්ප්‍රදයන්ට පටහැනි හා අහිතකර තත්වයක් බව පෙන්වා දිය යුතුය. 2008 ජූලි 08 වැනි දින නිකුත් කරන ලද පුවත් පත් නිවේදනයක් මගින් අප විසින් අවධාරණය කොට ප්‍රකාශ කරනු ලැබුවේ, මෙම කමිටු වලට අමාත්‍යවරුන් පත් නොකොට මූල්‍ය සුපරීක්ෂණ කමිටු වල ඵලදායි ක්‍රියාකාරීත්වය උදෙසා සුදුසු වාතාවරණයක් තහවුරු කරන ලෙසයි.

> **මාධ්‍ය නිවේදනය –**
> **පාර්ලිමේන්තු මූල්‍ය අධීක්ෂණ කාරක සභා නොපමාව පත් කරන ලෙස ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය රජයට බලකර සිටී.**
> http://tisrilanka.org/Press_Releases/pdf/PR_English.pdf

මෙම මූල්‍ය කමිටු වල සභාපතිත්වයට පත් වූ අමාත්‍යවරුන් දෙපල එම තනතුරු වලින් ඉල්ලා අස්වීමෙන්, පාර්ලිමේන්තු සම්ප්‍රදයන්ට ගරු කරන බව හා සුපිළිපන්න ක්‍රියාදමයකට කැපවීම පෙන්නුම් කරන ලෙසත්, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජේ.සී. වැලිඅමුණ මහතා පුවත් පත් නිවේදනය මගින් අවධාරණය කර සිටී.

එම පුවත්පත් නිවේදනය මගින් තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, පාර්ලිමේන්තුව විසින් මෙම ප්‍රශ්නගත තීරණ නැවත සලකා බැලිය යුතු බවත් විපක්ෂ මන්ත්‍රීවරු මූල්‍ය සුපරීක්ෂණ කමිටු වල සභාපතිත්වයට පත් කිරීමේ මූලික සිද්ධාන්තයට ගරු කළ යුතු බවත්ය.

පාර්ලිමේන්තු සම්ප්‍රදයයන්ට අනුව එවැනි කමිටු වල නායකත්වය විධායකයේ නොවන විපක්ෂ මන්ත්‍රීවරුන් විසින් දැරිය යුතු අතර සාමාජිකත්වයද විධායකයේ නොවන මන්ත්‍රීවරුන් විසින් පමණක් දැරිය යුතු වේ. මෙම සම්ප්‍රදයන් ශ්‍රී ලංකාවේද දීර්ඝ කාලයක් තිස්සේ ගරු කරමින් පවත්වා ගෙන එනු ලැබේ.

ජේ.සී. වැලිඅමුණ
විධායක අධ්‍යක්ෂක